## 1.1 හැඳින්වීම

මානවයා බිහි වූ දා පටන් ම තොරතුරු හුවමාරුවේ විවිධ ස්වරූපයන් අත්හදා බැලීමට යොමුවිය. ප්‍රථමවර මානවයාගේ සිට අද දක්වා වූ දිගු ගමන් මග තුළදී ඔහු තැබූ සෑම ඉදිරිපියවරක් ම සාර්ථක කරගැනීමට සන්නිවේදනය උපකාරී විය. සන්නිවේදනයේදී යොදාගත් සංඥා අද ප්‍රාථමික ක්‍රම වලින් මිදී දියුණු තත්ත්වයට පත්ව ඇත.


මිනිස් සංහතියේ විකාශනය තුළ සන්නිවේදනයේ මූලික හා ප්‍රබලතම වෙනස්කම් වලට බලපෑ අතිශය සාධනීය සාධකයක් වන්නේ තාක්ෂණයයි. අද වන විට ඉතා සරල සන්නිවේදන ක්‍රමවල සිට අතිශය සංකීර්ණ සන්නිවේදන ක්‍රම දක්වා මෙය පරිවර්තනය වී ඇත. මේ අනුව තාක්ෂණික ක්‍රම තුළින් මිනිස් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට මිනිසා යොමු වී සිටී.

කාර්මීකරණයෙන් සංකීර්ණ ජීවන රටාවකට හුරු වූ මිනිසා යාන්ත්‍රික නිෂ්පාදන උපයෝගී කරගෙන තම වැඩකටයුතු ඉටුකර ගැනීමට අද වන විට නිතැතින්ම යොමු වී සිටී.

> ගොවි කටයුතු නව තාක්ෂණික ක්‍රම වාරිමාර්ග, පොහොර, කෘමි නාශක, වල් පැලෑටි නාශක, ද්‍රව්‍ය භාවිතය යන සාධක සමග සංයුක්ත වී ඇති අතර ම දැනටමත් ලෝකය ඒ අනුව වේගයෙන් ඉදිරියට ගමන් කරමින් සිය නිෂ්පාදන වැඩිකර ගැනීමට කටයුතු කෙරේ (දෙශ කාන්ත. 2008 : පි : 61).

සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් දූරකතනය අපේ ජන ජීවිතය සම්බන්ධ වී දැනටමත් සැලකිය යුතු කාලයක් ගතවී ඇත. දූරකතනය තාක්ෂණික මෙවලමක් පමණක් ය යනුවෙන් ද අර්ථකථනය කළ නොහැක. ඒ තුළින් මහජනයාගේ සම්බන්ධතා වඩා ශක්තිමත් කර ඇත. විශේෂයෙන් ම සමාජ ව්‍යුහය සලකා බැලීමේ දී තිරස් සන්නිවේදනය උදෙසා මින් දැවැන්ත පිටිවහලක් ලැබී ඇත.

**සමාජීය බල ධූරාවලිය**



තිරස් සන්නිවේදනය

සිරස් සන්නිවේදනය

මේ අනුව සන්නිවේදන තාක්ෂණයේ වේගවත් හා විස්මයජනක දියුණුවත් සමග දුරකතන සන්නිවේදන තාක්ෂණය සරල හා සුලභ මෙවලමක් බවට පත්ව ඇත.

2000 වසර වන විට ශ්‍රී ලංකාවේ භාවිත මුළු දුරකතන සංඛ්‍යාව 7,68,620 (හත්ලක්ෂ හැටඅටදහස් හයසිය විස්සකි) කි. දුරකතන ඝණත්වය එනම් පුද්ගලයින් සියයකට ඇති දුරකතන සංඛ්‍යාව 47 කි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2002 - 8 - 1611)

පුළුල් ව්‍යාප්තිය වේගවත් බව හා සරල භාවිතය නිසා එය අද දැනුම හා තොරතුරු සන්නිවේදනයේදී මුල් පෙළේ මෙවලමක් බවට පත්වෙමින් තිබේ. ඒ නිසා පෙරදී පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනිය විසින් අත්පත් කොට ගෙනව තිබූ ප්‍රමුඛත්වය දුරකතනය වෙත ඉතා වේගයෙන් හිමි වෙමින් පවතී. රැහැන් සහිත දුරකතන 494,509 (1998) සහ රැහැන් රහිත ජංගම දුරකතන 228,604 (1999) මුල්කාලීන සංඛ්‍යා දත්ත පරීක්ෂා කිරීමේදී දැකගත හැකිය (http://www.photius.com).

නූතන තාක්ෂණික දියුණුවත් සමග ම සෑම රටක් ම සෑම කටයුත්තක් උදෙසාම දියුණු ශිල්පීය ක්‍රම යොදා ගනී. ජාතික සංවර්ධන ක්‍රියාදාමය තුළ රටක සෑම ක්ෂේත්‍රයක ම සංවර්ධනයක් ඇති වීම අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය ළඟාකර ගැනීමේදී කෘෂිකර්මාන්තය වැඩි ආංශික දායකත්වයක් දක්වන්නේ ය. ශ්‍රී ලංකාවේ භෞතික හා මානව සම්පත් වල ස්වභාවය අනුව කෘෂිකර්මාන්තය වඩා සංවර්ධනීය ලක්ෂණයක් කරා ගෙන යා හැකිය. කෘෂිකර්මාන්තය

ශක්තිමත් වූ වෘද්ධියට, සමස්ත ආර්ථික සංවර්ධනයට, බොහෝ ආකාරයෙන් දායක වී ඇත. ප්‍රධාන වූ හා වර්ධනය වන කෘෂි අංශය ඉදිරිපසට හා පසුපසට සම්බන්ධ වූ පුරුකක් ලෙසින් ක්‍රියාත්මක වේ (දදය කාණ්ඩ, 2006 : පි 55). ශ්‍රී ලංකාවේ වත්මන් කෘෂිකර්මය ඉතා වේගයෙන් සංක්‍රමණය සමග මුසු වෙමින් පවතී.

ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාව කෘෂිකාර්මික ජීවන රටාවකට යොමු වී තිබුණි. ශ්‍රී ලංකාව තුළ කාලය ගතවීම ත් සමග සාරවත් බිම් හිඟ වීම හා නිසරු වූ බිම් වැඩි වීමත් වර්ධනය වන ජනගහනයට සාපේක්ෂව ආහාරවල අවශ්‍යතාවන් වැඩි වීමත් නිසා ගොවිතැන් රටාව විවිධ වෙනස් වීම් වලට යොමු විය (ජේම්ස්, 1998 : පි : 03). එනම් ගම් නාගරීකරණය වූ රටාවකට යොමු විය. කෘෂිකර්මාන්තය මෙලෙස අප ආර්ථිකයේ ප්‍රධාන ආධාරකය නොවත් ආර්ථික වෘද්ධිය නංවාලීමට ඉන්ධන සපයන ප්‍රධානතම සාධකය ලෙසින් කරනු ලබන කාර්යභාරය සුළු කොට සැලකිය හැකි නොවේ (දදය කාණ්ඩ, 2006 : පි : 55). ශ්‍රී ලංකාව තුළ අදටත් සැලකිය යුතු ප්‍රමාණයක් තව ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තය කරගෙන යති.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මික නවීකරණයට අදාල විවිධ සංවර්ධන ව්‍යාපෘති වර්තමානයේදී ක්‍රියාත්මක වෙයි. නමුත් මෙම සංවර්ධන ව්‍යාපෘති සමාජගත කරමින් ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීමට සමත් වටපිටාවක් තවමත් ක්‍රියාත්මක නොවේ. බොහෝවිට දක්නට ලැබෙන්නේ පටු අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රමාණාත්මක වැඩපිළිවෙළ සමුදායකි. රජය නොයෙක් වැඩපිළිවෙලවල් ක්‍රියාවට නැංවුවද ඒවා සමාජ ගත නොවන්නේ නම් ඉන් රටට අපේක්ෂිත ඉලක්ක ජයගැනීමට නොහැකිවනවා මෙන් ම නිශ්චිත ප්‍රතිඵලයක් ද නොලැබෙනු ඇත. මේ නිසා ම වර්තමානය වන විට ශ්‍රී ලංකාව කෘෂි ක්ෂේත්‍රය අතින් ඌණ සංවර්ධිත මට්ටමක පසුවන රටක් බවට පිලියෙන් පසුබසිමින් සිටී.

ශ්‍රී ලංකාව සතු සම්පත් නිසි පරිදි භාවිත කරන්නේ නම් අපට කෘෂිකාර්මික අංශයෙන් ලෝකයේ පළමු තැනට පත්වීමේ හැකියාව ඇත. මේ සඳහා දේශීය කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ ශක්තිමත් ප්‍රායෝගික වැඩපිළිවෙළක අවශ්‍යතාවට මතු වී ඇත. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය පිළිබඳව සාකච්ඡා කිරීමේදී මෙරට සන්නිවේදන මාධ්‍ය තුළ ඒ සඳහා වන දායකත්වය සලකා බැලීම ඉතා වැදගත් වේ. 1950 දශකයෙන් පසු ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත නවීකරණයත්

සමාජගත කිරීමේදී මාධ්‍යවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සලකා බලනවිට පසුබැසීමක් දක්නට ඇත. එනම් ග්‍රාමීය වශයෙන් සම්බන්ධවුන් ව්‍යාප්තවූන් සන්නිවේදන රටාවක් මෙරට නොවීය.

1980 දශකයේදී මහවැලි ගොවි ප්‍රජාව ආශ්‍රය කරගෙන ප්‍රජා ගුවන්විදුලි මෙරට කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා විවිධ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක විය. නමුත් කල්යත්ම එම වැඩපිළිවෙළවල් විකෘතිකරණය වීම ඔස්සේ ප්‍රජා ගුවන් විදුලිය ද කෘෂිකාර්මික සංවර්ධන අරමුණු වලින් ඔබ්බට ගිය වෙනත් අරමුණු ඔස්සේ ගමන් කරන්නට විය. අනතුරුව 1982 දශකයේ ශ්‍රී ලංකාවට රූපවාහිනී සංස්ථාව පරිත්‍යාගයක් ලෙස ලැබීමත් සමගම සංවර්ධන සන්නිවේදන මාධ්‍යයක් ලෙස එය මෙරට ප්‍රචලිත වන්නට විය.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මෙරට ස්ථාපිත කිරීමේ පරමාර්ථය ලෙසට සඳහන් කර ඇත්තේ රටේ අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය ධීවර කර්මාන්තය හා විද්‍යා ඥානය සංවර්ධනය කිරීමට රූපවාහිනී මාධ්‍ය ප්‍රයෝජනයට ගැනීමයි ([illegible], 2004 : පි : 114). ඒ තුළින් ලංකාවේ කෘෂිකර්මාන්තයේ නවීකරණ කටයුතුවලට රූපවාහිනිය වඩා සාර්ථක මෙවලමක් විය. නමුත් වර්තමානය වන විට රූපවාහිනිය කෘෂිකර්මික ගොවි ජනතාවට ලබාදී මාධ්‍යයක් ලෙස සමීප වනවා වෙනුවට විනෝදාස්වාදය ලබා දෙන මාධ්‍යයක් ලෙස පමණක් සමීප වී ඇත.

1990 දශකයේ ආරම්භයේ සිට මෙම තාක්ෂණික ක්‍රියාකාරීත්වය තවදුරටත් පුළුල් වීම හේතුකොට ගෙන කෘෂිකර්මාන්තයේ සංවර්ධන අරමුණු පුළුල් විය. 1994 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානයේ දායකත්වය යටතේ කෘෂිකාර්මික වැඩසටහන්කරණය ආරම්භ වූ අතර එය වර්ධනීය අවධියකට ගෙනයමින් දූරකතන සේවාව මගින් කෘෂි උපදෙස් ලබා දීම දක්වා අද වන විට පුළුල් වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය මගින් අංක 1920 දරණ දූරකතන අංකයෙන් නොමිලේ සම්බන්ධ විය හැකි කෘෂි උපදෙස් හා තොරතුරු ලබාදීමේ සේවාව ආරම්භ කරන ලදී (http://www.agridept.gov.lk). මෙමගින් ගොවි ජනතාවට නිවැරදිව, සාර්ථකව කෘෂි කාර්මික දැනුම අවබෝධය සම්ප්‍රේෂණය කිරීමේ අවකාශයක මත අතරමැදියෙකු ලෙසට පුද්ගලාන්තර සන්නිවේදන මූලාශ්‍රයක් ලෙස දූරකතනය යොදාගැනීම අපේක්ෂා කෙරෙයි. ජන සන්නිවේදන මෙවලම් මගින් ගොවියා විවිධ මාර්ග වලින් කෘෂි දැනුම නූතන තාක්ෂණික ක්‍රමවේද සොයායාමට පොළඹවීම මේ වන විට සිදු කෙරෙමින් පවතී.